ෆෙයාෆස්ට් ඉන්ෂුවරන්ස් ලිමිටඩ්
(සමාගම් අංකයඃ PB5180)
ඇක්සස් ටවර්ස් ii (14 වන මහල),
නො. 278/4, යුනියන් පෙදෙස, කොළඹ 02,
ශ්‍රී ලංකාව.
දුරකථනඃ+94 11 2428428 | ෆැක්ස්ඃ +94 11 2438438
විද්‍යුත් තැපෑල (Email)ඃ info@fairfirst.lk
වෙබ් අඩවියඃ www.fairfirst.lk

# රක්ෂණ නිෂ්පාදන තොරතුරු ලේඛනය (IPID)

## සූර්ය ආරක්ෂිත රක්ෂණ ඔප්පුව - (Solar Secure Insurance)

## 1. ආවරණයේ විෂය පථය (Scope of Cover)

සූර්ය ආරක්ෂිත රක්ෂණය ඔප්පුව (Solar Secure Insurance) මගින් නේවාසික සූර්ය බලශක්ති පද්ධති (සූර්ය පැනල, ඉන්වර්ටර් සහ ආශ්‍රිත උපාංග ඇතුළුව) ගින්න, ස්වභාවික විපත්, විදුලි දෝෂ සහ වෙනත් රක්ෂිත සිදුවීම් නිසා සිදුවන අලාභ හෝ හානිවලින් ආරක්ෂා කරයි. සුන්බුන් ඉවත් කිරීම සහ හානියට පත් පැනල ප්‍රවාහනය කිරීම වැනි ඇතැම් අදාළ වියදම් සඳහා වන ආවරණය ඇතුළුව අතිරේක ප්‍රතිලාභද මෙම ප්‍රතිපත්තිය මගින් ලබා දෙයි.

## 2. ආවරණය වන දේ (What is Covered)

ගින්න සහ අකුණු ගැසීම, භූමිකම්පා, ගිනිකඳු පිපිරීම්, සුළි සුලං, සුළඟින් සිදුවන හානි, සුනාමි, වඩදිය බාදිය, ගංවතුර, විදුලි දෝෂ සහ අනෙකුත් රක්ෂිත උවදුරු නිසා සූර්ය පද්ධතිවලට සිදුවන භෞතික අලාභ හෝ හානි සඳහා මෙම ප්‍රතිපත්තිය යටතේ ආවරණය සපයයි.

### අතිරේක ආවරණ (Add-ons)ඃ

- නීතිමය වියදම් (Legal Expenses) - රු. 5,000 දක්වා
- සුන්බුන් ඉවත් කිරීම (Debris Removal) - රු. 5,000 දක්වා
- ගොඩනැගිලි අලුත්වැඩියා කටයුතු සඳහා සූර්ය පද්ධතිය ඉවත් කර නැවත පිහිටුවීමේ පිරිවැය - රු. 10,000 දක්වා
- අලුත්වැඩියා කිරීම සඳහා ප්‍රවාහනය කිරීමේදී හෝ ගබඩා කර තැබීමේදී සිදුවන හානි - රු. 5,000 දක්වා
- සූර්ය පද්ධතිය ස්ථාපනය කර ඇති ගොඩනැගිල්ලට/ව්‍යුහයට සිදුවන හානි (වෙනත් තැනකින් ආවරණය වී නොමැති නම්) - රු. 5,000 දක්වා

- හානියට පත් සූර්ය පැනල සේවා නියෝජිත වෙත ප්‍රවාහනය කිරීම - රු. 5,000 දක්වා
- සතුන් නිසා කේබල්වලට සිදුවන හානි - රු. 5,000 දක්වා

## 3. ආවරණය නොවන දේ - බැලූ බැල්මට (What is NOT Covered)

රක්ෂිතයාගේ කිසියම් හිතාමතා කරන ලද ක්‍රියාවක්, සාමාන්‍ය ගෙවී යාම (Normal Wear and Tear), හෝ යාන්ත්‍රික හෝ විදුලි බිඳ වැටීම් හේතුවෙන් සිදුවන අලාභ හෝ හානි මෙම ඔප්පුව යටතේ ආවරණය නොවේ.

## 4. වාරික ගෙවීම (Premium Payment)

ඔප්පුවේ කාලය සඳහා (සාමාන්‍යයෙන් වසරක්) සම්පූර්ණ වාරිකය එකවර ගෙවිය යුතුය.

## 5. රක්ෂණකරුගේ බැඳීම් (Policyholders' Obligations)

කිසියම් අලාභයක්, හානියක් හෝ හිමිකම්පෑමකට තුඩු දිය හැකි තත්ත්වයක් මෙන්ම, අවදානම් තත්ත්වයට බලපෑම් කළ හැකි කිසියම් දෝෂයක් හෝ මෙහෙයුම් වෙනසක් පිළිබඳව ෆෙයාෆස්ට් ඉන්ෂුවරන්ස් (Fairfirst Insurance) ආයතනය වෙත වහාම දැනුම් දිය යුතුය.

තවදුරටත් සිදුවිය හැකි අලාභ  හානි අවම කිරීමට සාධාරණ පියවර ගත යුතු අතර, රක්ෂණකරුගේ එකඟතාව ලබාගෙන  වෙනස් කිරීමකින් හෝ අලුත්වැඩියා කිරීමකින් තොරව පරීක්ෂා කිරීම සඳහා හානියට පත් භාණ්ඩ ආරක්ෂා කර තැබිය යුතුය.

අදාළ සියලුම ආධාරක සාක්ෂි සහ ලියකියවිලි සැපයිය යුතු අතර, හිමිකම් විමර්ශනවලදී සම්පූර්ණ සහයෝගය ලබා දිය යුතුය

## 6. පැමිණිලි සහ දුක්ගැනවිලි හැසිරවීම (Complaints and Grievance Handling)

**පියවර 1 - ෆෙයාෆස්ට් ඉන්ෂුවරන්ස්** (Fairfirst Insurance) ආයතනය අමතන්න:

☎ +94 11 2335167 (පෙ.ව. 8:30 සිට ප.ව. 5:00 දක්වා)

✉ info@fairfirst.lk

ඔබට පවතින ගැටලු ෆෙයාෆස්ට් (Fairfirst) ආයතනයේ අවදානම් සහ අනුකූලතා (Risk & Compliance) කණ්ඩායම වෙත යොමු කළ හැකිය.

**පියවර 2 - බාහිර පාර්ශව වෙත යොමු කිරීම** (ගැටලුව විසඳී නොමැති නම්):

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව (IRCSL):

☎ +94 11 2335167 | ✉ info@ircsl.gov.lk | 🌐 www.ircsl.gov.lk

රක්ෂණ ඔම්බුඩ්ස්මන් (Insurance Ombudsman)‍:

☎ +94 11 2505542 / +94 11 2505041 | ✉ [info@insuranceombudsman.lk](mailto:info@insuranceombudsman.lk) | 🌐 [www.insuranceombudsman.lk](http://www.insuranceombudsman.lk)

7. **වැඩි විස්තර සඳහා අප අමතන්න**

**ෆෙයාෆස්ට් ඉන්ෂුවරන්ස් ලිමිටඩ්** (Fairfirst Insurance Limited)

ඇක්සස් ටවර්ස් ii (14 වන මහල), අංක 278/4, යූනියන් පෙදෙස, කොළඹ 02, ශ්‍රී ලංකාව.

☎ +94 11 2428428 | ✉ [info@fairfirst.lk](mailto:info@fairfirst.lk) | 🌐 [www.fairfirst.lk](http://www.fairfirst.lk)

**වැදගත් සටහන:**

IPID ලේඛනය මගින් ප්‍රධාන ආවරණයේ සාරාංශයක් සහ අදාළ නම් අතිරේක ආවරණ සහ ඔප්පුවේ ප්‍රධාන ලක්ෂණ සැපයීමට අදහස් කරන අතර, එය ඔබගේ විශේෂිත පුද්ගලික අවශ්‍යතාවලට ගැලපෙන ලෙස සකස් කර නැත. නිෂ්පාදනයේ සම්පූර්ණ හා පුද්ගලීකරණය කළ තොරතුරු සහ බැහැර කිරීම් පිළිබඳ සම්පූර්ණ පූර්ව-කොන්ත්‍රාත්තු සහ කොන්ත්‍රාත්තු නියමයන් ඔබේ ඔප්පු උපලේඛනයේ සපයා ඇත. IPID යනු ඔප්පුවේ/කොන්ත්‍රාත්තුවේ කොටසක් නොවනු ඇත. එමනිසා, කිසියම් ගැටුමක් ඇති වූ විට, ඔප්පු ලේඛනයේ සඳහන් නියමයන් සහ කොන්දේසි බලපැවැත්වේ.